# අඳුරු වූ ලොවක් අභියස



දෙව්මි නවෝදයා

# අඳුරු වූ ලොවක් අභියස

## දෙව්මි නවෝදා

© දෙව්මි නවෝදා මුණසිංහ

පළමු මුද්‍රණය - 2023 නොවැම්බර්

# පිදුම

නව චින්තනාවලියකට වෙර දරන

සහෝදර සහෝදරියන්ට ආදරයෙන් යුතුව

පිළිගන්වමු.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත් වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩනැගීම අපේක්ෂාවයි. ඒසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. ඒම ජාතික අරමුණ මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුම කරගත් මහාමායා දියණියන් වසර ගණනාවක සිට විවිධ අරමුණු පෙරදැරි කොට ගෙන ග්‍රන්ථකරණයට යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කොතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණය කරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයකු වීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොකත් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක් වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ! ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමව්පියන් ආදී ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමු කළ විදුහල්පති වරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023.11.01

# පටුන


| | |
|---|---|
| 1. ලක් මවුනි | 01 - 02 |
| 2. මවකගේ පැතුම | 03 |
| 3. මහා ඝන කතරකට...... | 04 |
| 4. ගනඳුරු අහසේ...... | 05 |
| 5. දිසාපාමොක් පරපුරට නමස්කාරයක් | 06 |
| 6. දෙවැනි මවුන් | 07 |
| 7. අඳුරු වූ ලොවක් අභියස | 08 - 09 |
| 8. මිතුදමක අගය | 10 |
| 9. හිමි සඳ | 11 |
| 10. ස්වප්නය | 12 |
| 11. මිතුර ඔබ වැළඳගමි | 13 |
| 12. යුතුකම | 14 |
| 13. සාමය | 15 |
| 14. හිමියනි නෙලුමකි ඔබ.............. | 16 |

# 1. ලක් මවුනි

සොදුරු වූ ලොවක් දෙස

නෙත් යොමා බලන කල

දිටිමි එක දසුනකදු සිත

මුදා ගත නොහැකි.............

සොයමි,සෙවුවෙමි නිතර

කිමද? ඒ දසුනකි කියා................

ඉන්දියන් නම් සගරේ වු

පිහිටි මුතු ඇටයක් ලෙසින්

නාමයක් ලැබ තිබුනි එවිටත්.............

මම ද ඉපදී ඇති හෙයින් එහි

විදිමි සතුටක් මහත් බැතියෙන්,........

ලංකාව නම් වු ඒ මහා රට තුළ

සිටින නරයින් සැවොම

ගුණ ඇතැයි කියා මා

ඇසූවෙමි සතුටින්ම...............

එම නිසා සොයන්නට

සිත් බැදුණි ඒ ගැනම......

සොයමි දුටුවෙමි

ලක් මවගෙ වතගොත

තෘෂ්ණාව ඔද වඩන මිනිසුන්

සොරගෙන මිනිහරන ,නේක පැළදුම්

නිරුවත්ය ලක් මවම නිරතුරු..........

බුදුරදුන් දෙසු නිවන් පිලිවෙත ඇයිද?

අමතකම වූයේ..........

තෘෂ්ණාව පොදි බදින මිනිසුනි

කිම්ද ඔබගේ සතුට වන්නේ...........

## 2. මවකගේ පැතුම

යහපත් ගුණයෙන් හැඩවුණු
මගේ රත්තරන් පුතේ......
නුඹ හින්දයි මම උත්තම මවු
පදවිය ලැබුවේ පුංචි පුතේ.............

දින සති ගෙවෙනා තලෙන් තලෙට
නුඹ ලොකු වූවා පුංචි පුතේ
බොදවී යන්නට දෙන්න එපා නුඹෙ
යහපත් අරමුණු පුංචි පුතේ................

මම හිනැහෙන්නේ
මම සැනසෙන්නේ
නුඹ ගැන සිතලයි,නුඹ ගැන බලලයි
පුංචි පුතේ....................

යනු මැන පෙරටම අනෙකා සමගින්
එක් වීලා මගෙ පුංචි පුතේ
දිනපන් හෙට ලොව සඵල කරන්
අප දෙදෙනගෙ අරමුණු පුංචි පුතේ.........

## 3. මහා සන කතරකට......

මහා සන කතරකට උතුම් දිය බිඳක් වී
මහා සන අඳුරකට
පුර සඳක් වී............
නැගිටිමින් ජය ගන්න
ශක්තියක් වූ ඒ මහා වටපවුර
ඔබයි ආදරණීය පියාණෙනි........

දෑතේ කරගැට ඇතිමුත් සරියේ
දහදිය වගුරා අප දිවි රැකුවේ
දරුවන් දිනවීමට නොව
දරුවන් රජ කරවීමටය සෑම දිනයේ.............

දහසකුත් ගැටලු මැද
දිරිය ගෙන නැගිටින්න හැකි වේය
සැමදිනේ.............
මෙවන් වූ සෙනෙහසට කිම
අඩුව ලියවුණේ........
කවි ගීත පමණක්ම

## 4. ගනදුරු අහසේ......

ගනදුරු අහසේ එළි විහිදා
ජීවිත මන් පෙත් එළිය කරන්නට
දෝතින් ලොවක් නළවන්න
හැකි අරුම වූ ශක්තිය
ඔබයි මැණිය හැම කල්හිම....................

පහනේ එළියට දරුවන් උපමා කොට
වත් කරනා ලද තෙල් බිඳු ලෙසට
රුදිරය ,ශක්තිය ක්ෂය කර හැරියේ
ඔබගේ ඇති කුලුණු ගුන නිසාමය................
ආදරණීය මැනියණි...................

කෙතරම් ගුණ ඇතිව
සැලකුවද දරුවන්ට
නැත කිසිම ලාභයක්
පතන්නේ කිසි දිනේ................
එවන් වූ මව් වරුන්
සියලු දෙන එක වරම
බුදු වරුන්ගේ පිහිට ලබත්වා මතු දිනක......................

## 5. දිසාපාමොක් පරපුරට නමස්කාරයක්

එකලොස් වසරක් පුරාවට

පැමිණ ආ විදු මන් පෙතේ

ජය ටැඹ කරා ගොස් ජය දද ඔසවන්න

ලබා දුන් ශක්තිය අපමණය

ගුරු මැනියණි පියාණෙනි ................

දිසාපාමොක් පරපුරෙන්

රැගෙන ආ ගුණ කදින්

කුරිරු වූ මේ ලොවේ දිරිය ගෙන

දුර යමින්....................

බුද්දියේ ඇස යොමා මේ ලෝකෙ

ජය ගමින්

දරා ගත නොහැකි දුක් සමසිතින් විදවමින්

සිප් කිරෙන් අප තෙමා ශක්තියක්

ලබා දුන්නේ

ඔබයි ගුරු මැනියනි..........

ඔබයි ගුරු පියනෙනි.......

කටුපදුරු දෝතින් නෙලන්

බොහෝ දුර දිවයන්න

දැනුමෙන් සන්නද්ද මහා සයුරක් වන්න.............

දැනුම අවිය කොට නිවටුන්

නොවී නැගිටින්න

දුන් ඔවදනින් හැක අපට

ජය ගන්න...............

## 6. දෙවැනි මවුන්

දෙවැනි මවුන් ලෙස දියතෙහි පතුරා
දරු රුවන් සනසා සිප් කිරි ලබා දුන්
ගුරුමග අනුව ගොස් ඔවදනින් නගිටින්න......
ශක්තියක් වූ ඒ මහා වට පවුර
ඔබයි පාසල් විදු මාතාවනි.......................

ගොඩවෙල ගම් පියසේ ඉදි වී
ගමක් තනන්නට ,ලොවක් දිනන්නට
හැකි මිනිසුන් බිහි කෙරුවේ
ඔබයි විදු මැණියණි............

ඇළ දොළ කදු වැටි එක් කරමින්
ළමයින් හට කුලුනෙන් සලකා
සිප්කිරි දෝතට ගෙන නහවා
දයාව දුන් ඒ අප්‍රාණික වස්තුව
ඔබම නම් විය විදු මැණිය........

ගුරු මව්පියවරු හා ළමයින්
නගනා ජය හඩ දෝතට ගනිමින්
මිනිසුන් අතරේ නැති ගුණ නගමින්
අද දින මෙන් මතු දැයක් තනන්නට.........
සව්මෙත් කිත් යසසින් පිරිනමින්
යුතුය ගොඩවෙල විදුමැණී...............

## 7. අඳුරු වූ ලොවක් අභියස

කුණු කාණු ටින් බෙලෙක්
දෝතින් උරුම කරන්
කල් ගෙවන ජීවිතය කෙතරම්
අමිහිරිද?............

අහස් කුස සිප ගන්න
තරම් ඉදිවන ගොඩනැගිලි අතරේ
නැද්ද අප හට නිවහනක්
නැද්ද අප හට පිළිසරණයක්
ඉකිබිඳිනු ඇසුණි මට
මහත් වූ දොම්නසින්..........

වැතිර සිටිනා වැරහැල්ල
යට ඇතිය පන ගැහෙන හදවතක්
දුටුවාද නුඹ පයට
පැගෙනා බව ඉන් කොනක්........

සෝෂාව නන්වමින් යනෙනවා
බස් වැන් රත
ඇඳුම් පැළඳුම් ඇඳන්
මහත්තුරු නෝනලා
පියනගති හැම තැනම............

කුසගින්න වැරහැල්ල අයිති කිම හැමදාම
කුණු කානු ටින් බෙලෙක් අතාරින්න ඉඩ නැතිද.....

කිම්ද? ඔවුනගෙ නොගැටුණේ නෙත

එක් දිනක මම දුටු දෙයක්

එකම ලේ ඇති ලෝකයක් තුළ

වර්ණ කුල භේදයන්ට

පණ පොවන්නේ කිම හැමදාම..........

## 8. මිතුදමක අගය

පාසල් කාලේ අමතක වන්නේ
නෑ අපහට කවදාවත්
එහිදී අපගේ සිහියට නැගුණේ
මිතුරන් පමණකි හැමදාමත්.............

කෑම වලින් කොටසක් දුන්නා
කෑම නොගෙන ආ ළමයින් හට පෙරදා
ඩෙස් පුටු ඉදහිට අඩු වුණු දා
එක පුටුවේ අපි ඉද ගත්තා......

මතකද ඔබහට මිතුදමක අගය
කෙතරම් වටිනවද කියා...........

විටෙක දුක් කරදර
විටෙක විෂය කරුණු
බෙදාගත් ඒ අපූරු මිතුදම
නැවතත් එනවද ඉකිබින්දා................

කවදා හෝ ඔබ අප හමුවෙමු
පෙර ගෙවූ කාලයෙ මතක අරන්...........

## 9. හිමි සඳ

හිමි සඳ.....හිමි සඳ.....
පිහිට වනු මැන
නැවත වඩිනු මැන
මේ ලෝ කතරට........
සරණ වනු මැන එතෙර කරනට
අපේ මේ දුක් ජීවිතේ..........

ක්‍රෝද ගින්නේ ඔබේ බුදු ගුණ
වැනසිලා ඇත ලෝක කතරේ
අවිදු දහමකි
පැතිර ඇත්තේ
තෘෂ්ණාව මුල් කර ගමින්.........

අකුසලය ඇත රජ වෙලා
කුසල් පින්දම් යටපත් වෙලා
වඩිනු මැන හිමියනේ
විහිදුවන්නට දහම් අම ගුණ..................
සුපිපි නෙලුමක් ලෙසින් මිනිස්
හද ගැඹරේ.................

## 10. ස්වප්නය

සඳ නැති මහ නිශා රැයේ
දුටුවෙමි ජීවිත කතරේ
කටුකය, දුක්බරය
ආ මේ ගමනේ........

කඳු මුදුන ලස්සනද කොයි තරම්
පහත ඇති කටු ගස් වලට වඩා
කඳු මුදුන තරණය කරන්නටවත්
තියනවද මට ශක්තියක්...............

නමුදු වටහා ගන්න යුතු වේ
එහිය ඇත්තේ අපේ දිනුමන්.......

තරණය කළොත් අපමණ වෑරෙන්
කිසියම් දිනක..............
සිප් සොයන දිවි මගේ කඳු මුදුනෙහි
තැබූ විට පය
දැනේවි ජීවිතේ විදි ගැහැටයන්
සුපිපි මල් යායක් ලෙසින්............
එවිට සිත් වේ සඵල වී ඇති බැව්
ජීවිතේ ඇති ස්වප්නයන්.............

## 11. මිතුර ඔබ වැළඳගමි

මිතුර ඔබ වැළඳගමි
දෝතින්ම මම............
මාගේ දිවියට
මිතුර ඔබ හැර නොයමි
වන තුරු මාගේ ජීවිතය අවසන්............

නොහැක මට යන්නට
මුලු ලෝකයම වටේ
එහෙත් ඔබ මා රැගෙන ගොස්
දියත සිසාරා දුන් ඔවදන්
සවිය වෙයි මතු ජීවිතේ..............

මිතුර නුඹ අපමණය
නුඹේ නම පොත් පත්‍ය
නුඹේ ගරු බුහුමනින්
ලදිමි මම නෙක කිරුලු.......................

මිතුර ඔබෙ ඇසුරටම
වැළඳගමි මම ඔබව
සිප ගනිමි නුඹෙ දැනුම
හැර නොයන අදිටනින්.............

## 12. යුතුකම

එකිනෙකා තව කෙනෙකු අබියස
සොයති නිරතුරු යම් දෙයක්
සොයන දේ නොලැබුනොත් එහි
ඇති වේය මහ ගැටලුවක්............

අකුරු හතරක් අතරේ කොටුවී
ගෙවන ජීවිතය මනරම්
කෙළවරක් නැති සාගරය සේ
යුතුකමෙද පරතෙරක් නොපෙනේ..................

එක් අයෙකු තව අයෙක් සමගින්
බැදී ඇත්තේ යුතුකම් නිසාමය...........

නෙත් යොමා බැලූ කල
ඇත්තෙ වැඩ වර්ජනයන්
උද්ඝෝෂණ හා ගැටලු ඝෝෂා
පමණි රට ඇතුළෙ හැමතැන....................

කිම්ද,පාලකයින්ට අමතකම වූයේ
ඉටුවිය යුතු වූ යුතුකම් ඔබෙන්..................
යුතුකමින් පිරිහුනු රටක්
කෙසේ ගොඩ ගත හැකිද සැමකල්...................

# 13. සාමය

ලංකාව නම් රට ඇතුළෙ මහ
සිටිති ජාතීන් විවිද අයුරින්
සින්හලය,මුස්ලිම්ය,දෙමළය
වර නැගෙති හැම තැනම.....................
සැමකල්

නැත අපට ජන වර්ගයන්
ඇත්තේ එක වර්ගයකි
එකම ලේ ඇති ලෝකයක් තුළ
වර්ණ කුල භේදයන්
ඔප් නන්වමින් ඇති පල කිම්ද?.......................

සාමයක් ඇති තැනක
කරන්නට බැරි දේ කිම්ද....................
රටක් දෙස නෙත යොමා බලන කල
ඉකිබිදින හෙටක් නොව
ඇවැසි අපහට
සතුටුවන හෙටකි.....................

එසේනම් පෙළ ගැසෙනු මැන සැම
පොඩි තැනින් පටන් ගෙන......................
සාමයේ ජය ටැඹ තරණය කරන්නට................

## 14. හිමියනි නෙලුමකි ඔබ.............

සුගන්ධිත නෙලුමකිය ඔබ හැම

ගොහොරු මඩෙකින් උපත ලැබ ආ

නෙළා ගන්නට නොහැකි එහෙත්

ඔබේ මග යා හැකි...................

උතුම් වූ සගරුවන නුබ

සුපිපි වූ නෙලුමකි.............................

බුදුරදුන් දෙසූ මගෙම

පැහැදී

අනුව යනෙනා ඔබගෙ ගුණ කද

කියා නිමකර නොහැකි

හිමියනි.......................

එතෙර කරනට සසර කතරින්

පිහිට වනු මැන අප හටද හිමියනි.......................

තෘෂ්ණාව ක්ෂය කරන්

අකුසලෙන් වැළකෙමින්

පුහුදුන් මිනිසුන් අතරේ

නැගී සිටියා හිමියනි ඔබ............................

එතෙර කරන්නට පහන් තාරකාවක් ලෙසින්

දැස නොපෙනෙන භව අන්ධකාරයෙන්

එක්ව යමු අපි - එතෙර වෙමු අපි

මිදී තන්හා අන්ධකාරෙන්..................

# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතු වීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්ථනයන් හේතුකොට ගෙන පොත පතින් දුරස් වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇති කිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වර්ෂයේදී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා ගත් කතුවරියන්ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨතයන් වෙත ළඟා වීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල් වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශණය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමණයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම් කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොකත් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත් කතුවරයකු වීමට ශක්තිය ලැබේවායි ! පතමු.

මෙයට,

සෙනවිරත්න මහලේකම්,

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023.11.01